
# මෙත් සවිය


## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWSLETTER

• සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව • 2006 මාර්තු • මෙත්සවිය තුන්වන කාණ්ඩය • හත්වන කලාපය



නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා!
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා!
බැතින් තුන් රුවන් ඔප් නගම් වා!
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා!












2005.10.02 දින රහතුන් වැඩ සිටි ගල්ලෙන් අනූ නවයක් සහිත පිළිකුත්තුව රජමහා විහාරයේ පැවැත්වූ ත්‍රෛයිමාසික දාන සීල භාවනා වැඩසටහනේ අවස්ථා කිහිපයක්.
මෙම ස්ථානයේ මෙත් සවිය විසින් තනාගෙන යනු ලබන භාවනා මධ්‍යස්ථානයට සම්බන්ධව වැසිකිළි තැනීම, හා භාවනා කුටි තැනීම සඳහා ආධාර කළ පිංවතුන්ගේ විස්තර ඇතුළු පිටුවල දැක්වේ.



භාවනා මධ්‍යස්ථානයේ සැකසීම භාර කමිටුවේ පිරිසක් ද පහල ඡායාරූපයෙන් දැක්වේ.

**අප ගැන වචනයක් ....**

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාල විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන අන්දම, කාල කළමනාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩ සටහන් වැනි ඒ ඒ කාලවලදී පවත්වන වැඩ සටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන - ශීල - භාවනා වැඩ සටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරන විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි. වර්තමාන සාමාජික සංඛ්‍යාව දහස ඉක්මවන අතර මී ළඟ චිත්ත සංයම අභයාස හා භාවනා වැඩසටහන පැවැත්වීම හා නව සාමාජිකයින් බඳවාගැනීම සඳහා සාමාජික අයදුම් පත් නිකුත් කිරීම 2006 ජූනි මාසයේදී සිදුකෙරේ.

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු

## මීළඟ දාන-සීල-භාවනා වැඩසටහන 2006.04.02 දින දෙකළුවල දහම් පුහුණු භාවනා මධ්‍යස්ථානයේ දී

අප සංගමයේ මීළඟ ත්‍රෛමාසික දාන - සීල භාවනා වැඩසටහන හා රැස්වීම 2006 අප්‍රේල් මස 02 වන ඉරුදින හොරණ, දෙකඳුවල දහම් පුහුණු භාවනා මධ්‍යස්ථානයේදී පැවැත්වේ. වැඩසටහනට සහභාගී වන සියළු සාමාජිකයින් සිල් සමාදන් වීමට සුදුසු ඇඳුමින් පැමිණෙන්නේ නම් මැනවි. එදින පැමිණෙන විට හීල් දානය හා දහවල් දානය සඳහා ඔබට හා තවත් කෙනෙකුට සෑහෙන සේ පළතුරු රැගෙන එන්න. මෙත්සවිය භාවනා පවුල්වල සාමාජිකයින් එක් වී (දුරකථන මගින් සාකච්ඡා කර) අවශ්‍ය දානය රැගෙන එමද සිදුකල හැකිය. (මෙදින ආහාරය පළතුරු පමණි).

නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානාධිපති කිරම විමල ජෝති හිමියන් විසින් ආරම්භ කර ඇති මෙම භාවනා මධ්‍යස්ථානය තුළ භික්ෂුණී සාසනයද පිහිටුවා ඇති අතර ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සඳහා සති 2 ක තාවකාලික පැවිද්ද ද ලබා දෙනු ලැබේ. මීට අමතරව ගිහි පිංවතුන් හට නැවතී භාවනා කිරීමේ පහසුකම්ද ඇත. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසම සහිත මෙම ස්ථානය ඔබගේ අධ්‍යාත්මික වර්ධනය සඳහා කෙදිනක හෝ ප්‍රයෝජනවත් විය හැකි බැවින් මෙවර එම ස්ථානයට ගොස් දාන- සීල - භාවනා වැඩසටහන පැවැත්වීමට මෙත්සවිය විසින් කටයුතු යොදා ඇත.

භාවනා මධ්‍යස්ථානයේ වැඩවසන භාවනානුයෝගී ස්වාමීන්ද්‍රයන් වහන්සේලා විසිපස් නමකට පමණ හා ගිහියෝගී කිහිප දෙනෙකුට අළුයම 5.00 ට දෙන කැඳ පූජාවට, පෙ.ව. 6.45 හීල් දානය, දහවල් 11.30 ට දානය හා සවස ගිලන්පස මෙත් සවිය විසින් බාරගෙන තිබේ. දායක වීමට කැමති පිංවතුන් එදිනම ඉතා සුළු මුදලක් දහවල් දානයට පෙර ලේකම්තුමා වෙත බාරදෙන්න. (මෙය අත්‍යවශ්‍ය නොවේ. ඔබ කැමැත්තෙන් දෙන්නේ නම් පමණි). මෙම භාවනා මධ්‍යස්ථානයට පිරිකර පූජාකිරීමට කැමති භවතුන් භවනා මධ්‍යස්ථානයට දැනට හිඟවන පවතින පහත සඳහන් ද්‍රව්‍යවලින් (ගරු නායක ස්වාමීන්ද්‍රයන්ගෙන් හා කාර්යාලයෙන් අපකළ විමසීමෙන් දැනගත් පරිදි) යමක් පූජාකරන්නේ නම් එය විචාර බුද්ධියෙන් කරනු ලබන මහත් පුණ්‍යකර්මයක් වනු ඇත.

භාවනා කරන ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් මදුරු කොයිල් (දුගර) රෙදි පාපිසි, දාන ශාලාවට අවශ්‍ය පිගන්, කෝප්ප, පේහැදි, මේස හැඳි, ඉගෙන ගන්නා ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය A4 කඩදාසි කොල, පොත් පත්, බෝල්පොයින්ට් පෑන්, ආදිය හා දානය ගෙනයාම සඳහා භාවිතා කළ හැකි ප්ලාස්ටික් බාල්දි වැසිකිලි සඳහා බාල්දි, මුද්දර කවර, ටෝච්, ඉටිපන්දම්, පෙන්ටෝච් බැටරි, දැනට අවශ්‍ය ද්‍රව්‍යයයි. (මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍යනම් මෙත්සවිය දාන - සීල - භාවනා වැඩසටහනේ සංවිධායක සරත් ඉලංගන්තිලක මහතා වෙත දු. 0714893218 මගින් අමතා දැන ගත හැක.) මෙම ස්ථානයට සමහර දිනවල දානය නොලැබෙන බැවින් පිටි, සීනි හා හාල් පරිප්පු වැනි වියලි



ආහාර ලබාදෙන්නේ නම් කෘතඥ වන බවද අපවෙත කාර්යාලයෙන් දන්වන ලදී.

තවද මෙම ස්ථානයේ භාවනා ශාලාවට විදුලි පංකා නොමැති බැවින් මෙත්සවිය සාමාජික සමාජිකාවන්ගේ දායකත්වයෙන් විදුලි පංකා 10 ක් සවිකර දීමේ මහා පුණ්‍යකර්මය ඉෂ්ටකර කර දීමට අප කැමැත්ත ප්‍රකාශ කරළමු. මම විදුලි පාංකා, කැමති අයට තනිව හෝ කිහිපදෙනෙකු එක්ව හෝ පරිත්‍යාග කළහැකි අතර එම පාංකාවල පරිත්‍යාගකල අයගේ නම් සඳහන් කරනු ඇත. (බිත්තියට සවිකරන විදුලි පංකා 8 හා බිමතබන විදුලි පංකා 2 කි).

### බස් රථවල ආසන වෙන්කිරීම


ඉහත වැඩසටහන සඳහා මෙත්සවිය මගින් සපයන බස්රථවල යාමට බලාපොරොත්තු වන සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල ලගම ඥාතීන් හට අවශ්‍ය අසුන් ප්‍රමාණය 30.03.2006 ට පෙර කාර්යාලය (පරිපාලන නිලධාරී කුමාර මහතා 0714014467 හෝ බස්රථ සංවිධානය කරන සම ලේකම් චමින්ද මහතා 0773-065807) වෙත දැනුම් දෙන්න. එක් අයකු සඳහා බර පැන රු: 200/ - ක් වන අතර එය 2006.04.02 දින ඉහත මහතුන් වෙත ලබා දෙන්න. දුරකථන මගින් අසුන් වෙන් කරගත් අය නොපැමිණිය හොත් බස්රථ සඳහා ගෙවන මුදල් මෙත්සවිය මගින් ගෙවීමට සිදුවේ. ඒ නිසා පැමිණීම ස්ථිර නැති අය නිකරුනේ අසුන් වෙන්කර නොගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

## එදින සඳහා න්‍යාය පත්‍රය සැකෙවින් පහත පරිදිය

| | | |
|---|---|---|
| පෙ.ව. | 7.30 | කොළඹ -7 ධම්ම ගවේසී බෞද්ධාශ්‍රමයෙන් බස්රථ පිටත් වීම. |
| පෙ.ව. | 7.45 | වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් බස්රථ පිටත් වීම |
| පෙ.ව. | 9.00 | සිල් සමාදන් වීම හා ඉන් අනතුරුව එම ස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වන උඩුමියේ සුමනසාර හිමි විසින් පවත්වන භාවනා වැඩසටහන |
| පෙ.ව. | 10.15 | ගිලන්පස (උදේ සහ සවස ගිලන් පස සැපයීමේ මහා පුණ්‍යකර්මය කපිල රොෂාන් ඉල්පෙරුම මහතා (802) හා ප්‍රභා හිරෝෂණී ඉල්ලේපෙරුම (872) මහත්මිය විසින් සිදු කරනු ඇත) |
| පෙ.ව. | 10.30 | භාවනාව |
| පෙ.ව. | 11.15 | දානශාලාවට රැස්වන්න. භික්ෂූන් හා යෝගී උපාසක උපාසිකාවන් වෙත දහවල් දානය පෙ.ව.11.30 පරිනැමීම මෙත්සවිය සාමාජිකයින් අතින් සිදු කෙරේ. |
| දහවල් | 12.00 | මෙත්සවිය සාමාජිකයින් විසින් දහවල් දානය සඳහා පළතුරු වැලදීම |
| ප.ව. | 13.30 | සක්මන් භාවනාව හා සමූහ භාවනාව |
| ප.ව. | 2.00 | තාවකාලිකව පැවිද්ද ලැබූ භික්ෂූන් වහන්සේලා 15 නමක් උපවැදි කිරීමේ පිංකමට අවශ්‍ය අයට සහභාගී විය හැක. |
| ප.ව. | 3.00 | ධර්ම දේශනාව - ප්‍රධාන ශාලාව |
| ප.ව. | 4.00 | සිල් පාවරණය හා වැඩසටහන් නිමාව |
| ප.ව. | 5.30 | වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයට හා කොළඹ-7 ධම්ම ගවේසී බෞද්ධ ආශ්‍රමය (හෝ බොරැල්ල) වෙත බස්රථ පැමිණීම. |

සැ. යු. පෙ.ව. 6.45 ට පිරිවෙන හීල් දානය හා දහවල් 11.30 ට පිරිනමන දහවල් දානය ඉවීම පිහීම සඳහා පෙර දින රාත්‍රී සිට කටයුතු යොදා ඇත. මේ සඳහා ශ්‍රම පරිත්‍යාගයෙන් කටයුතු කිරීමට කැමති පිංවතුන් දාන සංවිධායක උපසභාපති සරත් ඉලංගන්තිලක මහතා (0714893218) හෝ සමලේකම් තුසිත දොඩංගොඩ (0777710765) මහතා අමතා වැඩි විස්තර ලබාගන්න.

### ගමන් මග




කොළඹ සිට 120 හොරණ බස්රථවලින් පැමිණ, හොරණ බස්නැවතුම් පලින් මහරගම හෝ මීපේ බසයක නැග, ආදර්ශ හන්දියෙන් බැසිය යුතුයි. (ආදර්ශ හන්දියේ සිට ත්‍රීවීලරයකින් ද දහම් පුහුණු මධ්‍යස්ථානයට පැමිණිය හැකිය).

තවද පනාගොඩ ආමි පන්සල අසලින් ඇති පිවිසන පාරෙන් හෝ අවිස්සාවේල්ල සිට පැමිණෙන අය හට මීපේ, පාදුක්ක හරහා හොරණ පාර මගින් ද පැමිණිය හැක. හෝමාගම සිට පැමිණෙන අය හට දියගම හරහා ආදර්ශ ගොවිපල හන්දියට පැමිණ ලගා විය හැක.

ලිපිනය - දෙකඳුවල දහම් පුහුණු භාවනා මධ්‍යස්ථානය, කහටපිටිය, කණන්විල, හොරණ. දුරකථන 0344286334ශ

## අපගේ ඉදිරි වැඩසටහන්

2006.05.07 ප්‍රථම ඉරුදින මාසික වැඩසටහන - TNL අමාදහර වැඩසටහනට සහභාගී වන පොල්ගහපිටියේ සුගතානන්ද හිමි විසින් කායගතාසති භාවනාව පිළිබඳ ඉන්දියාවේ නිෂ්පාදිත CD තැටියක් ද ඇසුරෙන් කරන ලබන ආකර්ශනීය දේශනය - කොළඹ -07 ධම්ම ගවේසී බෞද්ධ ආශ්‍රමයේදී පැවැත්වේ.

2006.05.12 2005 බුද්ධ ජයන්තිය වෙනුවෙන් වෙසක් පෝදා වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේදී අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මූලිකත්වයෙන් පැවැත්වෙන සිල් වැඩසටහ., වෙනත් පන්සල් වල සිරිතක් ලෙස පෝයට සිල් සමාදන් නොවන අයට විශේෂයෙන් මේ සඳහා අහභාගී විය හැක. එදින දහවල් දානය විහාරස්ථානයේ දායක මහතෙකු විසින් පිරිනැමීමට භාරගෙන ඇත. කුඩා පැටවුන් සහිත කිරි එළදෙනුන් මස්කඩයට විකිණීමට පහනම් කරන ලෙස ඉල්ලා කරනු ලබන සංදේශයක් සැකසීමට ද මෙදින බලාපොරොත්තු වේ.

2006.06.04 ප්‍රථම ඉරුදින මාසික රැස්වීම හා වැඩසටහන - ස්වර්ණවාහිණී පෝදා සාකච්ඡාවලට සහභාගී වන භාවනා කම්මට්ඨානාචාර්ය පාතේගම සුමනරතන හිමිගේ භාවනා පිළිබඳ ධර්මදේශනාව හා පුහුණු වැඩසටහන - කොළඹ - 07 ධම්ම ගවේසී බෞද්ධ ආශ්‍රමයේදී.

2006.07.02 ප්‍රථම ඉරුදින මාසික රැස්වීම හා වැඩසටහන - පෝදා රූපවාහිනී සාකච්ඡාවට සහභාගී වන කැලණිය විශ්ව විද්‍යාලයේ බෞද්ධ හා පාලි අධ්‍යයන අංශයේ මහාචාර්ය සුමන පාල ගල්මන්ගොඩ මහතාගේ දේශනය.- කොළඹ -07 ධම්ම ගවේසී බෞද්ධ ආශ්‍රමයේදී.

2006.08.06 2006 වසරේ තෙවන දාන - සීල - භාවනා වැඩසටහන හා සදහම් චාරිකාව -බු. ව. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් ලංකාවට භාවනාව හඳුන්වා දීම සඳහා පිහිටුවූ ස්ථාන දෙකකින් එකක් වන තලගල භාවනා මධ්‍යස්ථානයේ දී පැවැත්වේ.

**ඉහත වැඩසටහන් පිළිබඳව නාමික ලිපි මගින් දැනුම් දීමක් නොකරන බව කරුණාවෙන් සලකන්න.**

### මුද්දර පරිත්‍යාග අගයකරමු

මෙත් සවිය වෙත ලැබෙන ලිපි සඳහා පිළිතුරු යැවීමට විශාල ලෙස මුද්දර අවශ්‍ය වී ඇත. අපගේ අරමුදල් සීමා සහිත බැවින් මෙම සද්කාර්ය සඳහා රුः 5/- මුද්දර ලබාදීමට කැමති පිංවතුන් එම මුද්දර කාර්යාලයට ලබා දී එහි ඇති පෙතෙහි සටහන් කරන්න.

### විශේෂ පුණ්‍යානුමෝදනාව

- පිළිකුත්තුව ගල්ලෙන් සහිත රජමහා විහාරයේදී පැවැත්වූ දාන - සීල - භාවනා වැඩසටහනට දහවල් දානය වෙනුවෙන් පළතුරු පරිනැමූ රාගම පදිංචි හේමලතා මැණිකේ මහත්මියට, එම මහත්මියගේ මියගිය ස්වාමි පුරුෂයාට (වසර 6ක් සපිරේ), එතුමියගේ පියාණන් ඇතුළු මියගිය සියලුම ඥාතීන් හට හා සහභාගී වූ සියලු හිතවතුන්ට සගමොක් සුව ප්‍රාර්ථනා කරමු.

- මෙත්සවිය වෙනුවෙන් ගම්පහ පිළිකුත්තුව රජමහා විහාරයේ භාවනා කුටි සඳහා හෝ මල්වාන වැඩිහිටි නිවාසය සඳහා රුः 50000/- ක මුදලක් පරිත්‍යාග කළ සුජාතා දිසානායක මහත්මියට හා විශේෂයෙන්ම වසර 2 කට පෙර මිය පරලොව ගිය ඇයගේ ස්වාමියා වන මුදිත ලාල් දිසානායක මහතා ඇතුලු මියගිය සියළු ඥාතීන්ටද සග මොක් සුව පතමු.

## මෙත් සවිය ලිය සහන කාන්තා කමිටුව

ඉහත කමිටුව විසින් පවත්වනු ලබන සවිය සල්පිල
**සෑම මසකම අන්තිම ඉරුදින**
(2006 අප්‍රේල් 30 සහ මැයි 28... ආදී වශයෙන්)
නො. 29 පෙඩ්රිකා පාර, කොළඹ 06 ස්ථානයේ පැවැත්වේ.

- **තම දෑතින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ**
- **අඩු මිලකට හෝ සහන මිලකට ඉදිරිපත් කළ හැකි භාණ්ඩ**
- **තම ප්‍රදේශයේ සුලභව පවතින භාණ්ඩ**

*මේ සල්පිල සඳහා ඉදිරිපත් කිරීමට මෙත් සවිය සාමාජික ඔබ සැමට ආරාධනා කරමු.*

මේ අලෙවි භාණ්ඩ සඳහා අවශ්‍යතා දෙකක් අපේක්ෂා කෙරේ.

- ◆ එම අලෙවි කරන භාණ්ඩ වල ප්‍රමිතිය සාධාරණවිය යුතුය.
- ◆ අලෙවි කරන මිල, කොළඹ දැනට පවතින මිල ගණන් වලට වඩා අඩුවීමය.

*ඔබ දන්නා හඳුනන අයද මේ සල්පිල පිළිබඳව දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමු.*

උදාහරණ ලෙස මේ එන් එච් වර්ගය පිළිබඳව හැඳින්වුවහොත්,
**දෑතින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ** - උදා: පැච්වර්ක්, පින්තූර, පින්තාරු කළ භාණ්ඩ, කොට්ට උර, ඇඳුම් පැළඳුම්, කේක් වර්ග, කැවිලි වර්ග, රස කැවිලි වැනි දේ.
**සහන මිලකට පවතින ද්‍රව්‍ය** - උදා : හාල්, කිතුල් හකුරු, පොල්, පොල් පැණි, තේ කොළ වැනි දෑ

## මෙත් සවිය නොමිළයේ නිති උපදෙස් සේවය

**සාමාජිකයින් සඳහා අවශ්‍ය නීති උපදෙස් නොමිළයේ ලබා දීමට අපගේ පහත සාමාජිකාවන් වන නීතිඥ දයානි ද සිල්වා (දු. ක. 0777 684433) හා නීතිඥ මනෝජා ද සිල්වා මහත්මීන් ඉදිරිපත් ව ඇත. දුරකථනය මගින් අමතා අවශ්‍ය අයට මෙත් සවිය කාර්යාලයේ / පන්සලේ දී හමුවිය හැකිය. දුරකථන ඇමතුම් සතියේ දින වල සවස 5.00 න් පසු හෝ සති අන්තයේ ඕනෑම වේලාවක ලබා ගත හැක.**

*නවද මෙම නීති උපදේශ සහන සේවයට දායක වීමට කැමති අප සංගමයේ නීතිඥ මහත්ම මහත්මීන් වෙතොත් සභාපතිනුමා වෙත දන්වන්න.*

## මෙත් සවිය - කොළඹ නවාතැන් පහසුකම් සැපයීමේ සේවය

### *රෝගී සහන*

ලිය සහන කාන්තා කමිටුව වෙතින් දුර බැහැර වාසය කරන මෙත් සවිය සාමාජික මහතුන්ගේ හා මහත්මීන්ගේ මව, පියා හෝ දූ දරුවන් කොළඹ රෝහල් වල වෛද්‍ය පරීක්ෂන සඳහා යොමු කරන අවස්ථාවලදී ඔවුනට තාවකාලිකව දිනක් හෝ දෙකක් කොළඹ නැවතීමට අවශ්‍ය නම් ඒ සඳහා පහසුකම් සැලැස්වීමට ශ්‍රී විජයාරාමය ඉදිරිපිට නිවසේ වජිරා මෝතා මහත්මිය කාරුණිකව ඉදිරිපත් වී ඇත.

මෙත් සවිය පරිපාලන නිලධාරී මහතා
0714014467

## මෙත් සවිය මෛත්‍රී සංසඳයේ අසරණ සරණ කමිටුව

*04-09-2005 දින ආරම්භ කර ඇත.*
*පිහිටක් බලාපොරොත්තු වන අසරණ අය පහත දැක්වෙන ලිපිනයට විස්තර ලියා දන්වන ලෙස ඉල්ලමි. කමිටුව ඒ පිළිබඳව සොයා බලා සුදුසු අත්‍යවශ්‍ය අයට පිහිට වීමට බලාපොරොත්තු වේ.*
*තවද අසරණ අයට පිහිට වීමට බලාපොරොත්තු වන අයටද මේ සඳහා දායකත්වය සපයන මෙන් කාරුණිකව ආරාධනය කරමි.*

අසරණ සරණ කමිටුව, මෙත් සවිය මෛත්‍රී සංසඳය
ප්‍රධාන කාර්යාලය, ශ්‍රී විජයාරාමය
පෙඩ්රිකා පාර, කොළඹ 06.
දුරකතනය : 071-4014467

මහන මැෂිමක් අවශ්‍ය කෙනෙකු වෙතොත්
(දරිද්‍රතාවයෙන් පෙළෙන කාන්තාවකට / පවුලකට උපකාරයක් සේ පිරි නැමීමට)
කාර්යාලයට දන්වන්න.
සාමාජිකයෙකු විසින් මෙත්සවිය වෙත මහන මැෂිමක් ලබා දී ඇත.

## හිසට සෙවනක්

දුර පළාතක අනුරාධපුර හො කතරගම පදිංචි ව සිටින දුක්පත්ම පවුලකට නිවසක් සාදා දීමට කැමැත්තෙන් සිටිමි.
අවශ්‍ය කෙනෙක් ඇතොත් දන්වන්න.

සෝමා ආරියවංශ මහත්මිය (සා.අංක 1175)
නො 7. පළවන පටුමග
වොට්සන් පීරිස් මාවත. මොරටුව

## ගමේ පන්සලට පරිගණක මධ්‍යස්ථානයක්

ගම්බද පන්සල් අවට ජනතාව වෙත නවීන තාක්ෂණයන් ලඟා කරනු පිණිස රොටරි සමාජය අනුග්‍රහයෙන් පන්සල් 400 ක පරිගණක මධ්‍යස්ථා ඇරඹීමට ආචාර්ය චන්දන ජයරත්න මහතා කටයුතු කරමින් පවතී.


එක් මධ්‍යස්ථානයක් සඳහා පරිගණක පහක්, ප්‍රින්ටරයක්, ස්කෑනරයක්, හා අන්තර්ජාල පහසුකම් සඳහා CDMA දුරකථනයක් ලබා දෙනු ඇත. මෙම උපකරණ තැබීම සඳහා හා පුහුණු කිරීම සඳහා කාමරයක් පන්සලේ තිබිය යුතු අතර ප්‍රදේශයේ කෙනෙකු ඉදිරිපත් ව මසකට අවම පැය 40 ක වත් ඉගැන්වීම් කටයුතු කළ යුතුය. පාඨමාලා හා උපදේශක වරුන් සඳහා පුහුණුව අවශ්‍ය අයට දෙනු ලැබේ. නාගරික ප්‍රදේශ වලින් බැහැරව ඇති පන්සල් වල ස්වාමීන් වහන්සේලා මේ සඳහා කැමති නම් ඒ බව විමසා පහත තොරතුරු ද සහිතව ආචාර්ය චන්දන ජයරත්න මහතා නමට ලිපියක් මෙත්සවිය කාර්යාලයට මසක් ඇතුළත ලැබෙන්න සලස්වන්න. අවශ්‍ය විස්තර

1. පන්සලේ ලිපිනය හා දුරකථන අංකය.
. පන්සලේ ලිපිනය හා දුරකථන අංකය.
2. මෙමගින් ප්‍රදේශයේ සේවය ලබා ගැනීමට ඇති ගෙවල් ගණන සහ කොපමණ ජනතාවක් සිටිද (ආසන්න වශයෙන්) යන්න.
3. සම්බන්ධීකරණය කරනු ලබන මෙත්සවිය සාමාජික භවතාගේ නම හා ලිපිනය. (එක් සාමාජිකයෙකුට පන්සල් එකකට වැඩි ඕනෑම ප්‍රමාණයක් පිළිබඳ විස්තර ලබාදිය හැක.)

මෙම වැඩසටහන, පරිගණක පුවරුව (සිංහල/ඉංග්‍රීසි) හඳුන්වා දීම, පරිගනක භාවිතයෙන් ලිපියක් මුද්‍රණය කරන අයුරු හා ඊමේල්, අන්තර් ජාලය පිළිබඳ මූලික දැනුම ගොවි මහතුන්ගේ පටන් කැමති ඕනෑම කෙනෙකුට ලබා දීම අරමුණු කොට සකසා ඇත.

වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථනයෙන් ආචාර්ය චන්දන ජයරත්න මහතා අමතන්න.

# බුදු කෙනෙකුගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ



1. උස් නීෂය සහිත හිස
2. වම සිට දකුණට කැරකුණු අභිනීල හිස කෙස්
3. පළල් සාපු නළල
4. දකුණට කැරකුණු සුදු ඌර්ණ රෝම ධාතුව
5. අලුත උපන් වසුපැටවෙකු ගේ මෙන් දික්වූ රැවැති ඇසේ පිහාටු
6. අභනීල නේත්‍ර
7. දත් 40 කි
8. දත් විවර නොවී පිහිටීම
9. කිරි සුදු දත්
10. බ්‍රසක්මසවර ඇතිවීම
11. රසග්‍ර සාග්‍ර ඇතිවීම
12. මෘදු දික්වූ දිව
13. සිංහ හණු ඇත
14. මනාව ලස්සනට වැඩුනු බාහු, උරහිස්
15. සත්තැනෙක පරිපූර්ණ මාංශෝත්තද ඇතිවීම
16. උරහිස් අතර පිරුණු මස්පිඩු ඇතිවීම
17. රන්වන් සම
18. දෙදණිස දක්වා දික්වූ අත්
19. සිංහයෙකුට බඳු පූර්ණාධකාය
20. මහා බ්‍රහ්මයාගේ මෙන් ශරීරය ඇතිවීම
21. ඒකයික ලෝම සහිත
22. කෝෂයෙහි ගිළුණු අංගජාත ඇත

24. මනාව වටවූ බත් කෙණ්ඩා ඇතිවීම
25. ජාලහස්ත පාද
26. සමාන දිගැති මෘදු අත් පා ඇඟිලි
27. දික්වූ විලුඹ
28. උස්වූ පිටි පතුල්
29. දීක්. මෘදු පතුල් හා අත්
30. රජස් දැලි නොලැගීමට සියුම් සිවියකින් යුක්ති වීම
31. සුප්‍රනිෂ්ඨිත පාද
32. දහක් අර ඇති නිම් වළලු පියොනැබ මඩුලුපියො පරිපූර්ණ චක්‍ර සහිත යටි පතුල්

සා. අංක 103

සසර කතරින් එතෙර වීමට ලෙව් සතුන් වෙත මහා කුළු නින්
අමර නිවනින් සිසිල ලැබදුක් බුදුපියාණන් වඳිම් බැතියෙන්
සතර සක්දම් මුනි වදාලූ නැමද කිරපින් බවුන් වඩමින්
අඳර අරි සඝ රුවන් වඳිනෙම් තුන් වෙනුව අප පින් කෙතක් වන්

උතුම් වූ නිවන් මග පසක් වනයුරු ඔවුන් වැඩමට
දහම් ඔවදන් නිතර පවසන චන්දන ජයරත්න ගුරුතුමට
පැතුම් බර හදවතින් හරසර නිරාමිස ලොව්තුරා සැපතට
පුදමු මේ ලෙස හදින් මතුවන සුහද පිවිතුරු නෙළුම් මල්මිට

එස්. ආරියවංශ මිය
සා.අ. 6-1175 -

## පිළික්කුව භාවනා මධ්‍යස්ථානයේ ජලය සැපයීම - වැසිකිලි ඉදිකිරීම් සඳහා ආධාර ලබාදුන් අය

| ලබාදුන් අය | මුදල රු |
| --- | --- |
| 01. 07/08/05 දින පිළිකුත්තුවේදී සාමාජිකයින්ගෙන් පොදුවේ එකතු වූ මුදල - | 27,245.00 |
| 02. තිලකසිරි මුතුකුඩ මෙනවිය - | 5000.00 |
| 03. සඳා අහුබුදු මහත්මිය - | 10,000.00 |
| 04. නන්දනී විජේසේකර මිය(සා.අ.1097) - | 500.00 |
| 05. රෙජිනා සමරසිංහ මිය - | 10,200.00 |
| 06. වෛද්‍ය ඩී.ටී.පී. ලියනගේ මිය- | 15.000.00 |
| 07. සුජාතා දසනායක මිය - | 50,000.00 |
| 08. පද්මා ජයසිංහ මිය ඇතුළු 16 කගේ පිරිස- | 20,000.00 |
| දෙනෙකුගේ නම් ලැයිස්තුව අමුණා ඇත | |
| 09. චන්ද්‍රිකා ද සිල්වා මිය- | 5,000.00 |
| 10. එස්. මෙන්ඩිස් මහතා සහ පිරිස - | 902.00 |
| 11. ප්‍රදීපා ලුම්බිණි ද සිල්වා මිය - | 6,000.00 |
| 12. වසන්ති ද සිල්වා මිය (එච්.ජී.ඩබ්. සොයිසා ගුණසේකර මැතිණියට පිං පිණිස)- | 20,000.00 |
| එකතුව | 169,847.00 |
| ජලනල පද්ධතිය සඳහා වියදම් වූ මුදල | 18,470.00 |
| වැසිකිලි ඉදිකිරීම් සඳහා දනට ගෙවා ඇති මුදල - (ඉදිකිරීම් අවසන් කර නැත) | 85,000.00 |
| ඉතිරි මුදල | 66,377.00 |

# මල් පූජා කරන අතර මේ ගැනත් සිතමු

පූජේමි බුද්ධං කුසුමේන නේන
පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදම්මේ
කායෝ තථායාති විනාස භාවං

මේ ගාථා පාඨය බෞද්ධ වන අය කාටත් හුරු ඇත්තකි. එය අප කුඩා කල සිට මේ වන තෙක් දස දහස් වරකට වඩා ප්‍රකාශ කර ඇත්තෙමු. මේ ගාථා පාඨය අප බුදුරජාණන් වහන්සේට මල් පූජා කරන ගාථාවයි. පිරිසිදු මල් දෝතක් නෙලාගෙන, පැන් ටිකක් ඉස මේ ගාථාව කියමින් ඒ මල් බුදුරජාණන් වහන්සේට පූජා කරන්නෙමු. මෙම ගාථාවෙන් මල් පූජා කරන අතර ඊට වඩා ගැඹුරු අර්ථයක් ද ප්‍රකාශ වේ. බෞද්ධයා තුළ පවතින පාරිශුද්ධත්වයක්, ජීවිතයේ පවතින අනිත්‍ය භාවයත්, පාලි භාෂාවෙන් දැක්වෙන මෙම ගාථාව සිංහලට පරිවර්තනය කර ගැනීමෙන් අපට ඒ බව මැනවින් පසක් වේ.

**අනේන කුසුමේන - මේ මලින්,**
**බුද්ධං පූජේමි - බුදුරජාණන් වහන්සේ පුදමි.**
**එතේන පුඤ්ඤේන - ඒ පිනෙන්,**
**මොක්ඛං ලභාමි - මෝක්ෂය හෙවත් නිවන ලබන්නෙමි.**
**ඉදං පුප්ඵං - මේ මල්,**
**යථා මිලායාති - යම් සේ පරවේද,**
**තථා - එසේම, මේ - මාගේ,**
**කායෝ - කයද,**
**විනාස භාවං යාති - විනාසයට පැමිණේ**

යනු එහි අරුතය.

මෙයින් ප්‍රකාශ වන ගැඹුරු අර්ථය වන්නේ, මලක් යනු පැහැයෙන්ද, සුවඳින්ද, මුදු මොලොක් බවින්ද යුක්ත වන්නකි. පාරිශුද්ධත්වයේ සංකේතයකි. එහෙත් නටුවෙන් ගැලවුනු පසු හෝරා කීපයකදී පරවීමට හෙවත් විනාශයට පත්වේ.

අපේ කයද මේ සවභාවයෙන් යුතු බව මෙම ගාථා පාඨයෙන් ප්‍රකාශ වේ. කය යනු ශරීරයයි. ශරීරය සකස් වී ඇත්තේ ඇස්, හිස්, මස්, ලේ ආදී සියලු දෙය එක් වීමෙනි. ශරීරයේ අංගෝපාංග මෝඩයාටත්, උගතාටත්, බාලයාටත්, මහල්ලාටත්, නොවෙනස්ව පවතී. මේ කිසිම භේදයක් නැතිව කාගේ වුවද ශරීරය දිරාපත් වීම ස්වභාවය වී ඇත.

අප පූජා කරන මල් නොයෙක් වර්ණයන්ගෙන්ද, නොයෙක් සුවඳින් ද, නොයෙක් හැඩයෙන් ද යුතුය. එමෙන්ම සමාජ ගත පුද්ගලයන්ද එකෙකු තවකෙකුට සමාන කළ නොහැක. මිනිසා යනුවෙන් හඳුන්වන සත්වයා ද ජීවත් වන කාලය තුළ පිරිසිදු ජීවිතයත්, සුවඳවත් ජීවිතයක් සහ මනා හැඩයක් ඇති ජීවිතයක් ගතකළ යුතුය. සැබෑ බෞද්ධයා මලකට අනුව ජීවිතය ගතකළ යුතු බව මෙම ගාථාවෙන් කියවෙන බව සඳහන් කළ යුතුය. සීලයෙන් පිරිසිඳුව, ගුණ දහමින් සුවඳවත් වූ විට පිළිවෙලකට හෙවත් එක්තරා රටාවකට ජීවිතය ගතකළ හැකිවේ.

අප මල් පූජා කරන්නේ බුදු සිරිපා අභියස හෝ චෛත්‍යයන් අභියස හෝ බෝධියක් අභියසය. මේ ස්ථාන උත්තරීතර පිරිසිදු ස්ථානයෝය. එසේ පූජා කරන මලද උත්තරීතර තත්වයක් ලබයි. ඒ මල් මිලාන වී යන්නේ උත්තරීතර තත්වයකට පත්වී අවසානයේය.

එමෙන්ම අපද මල් පූජා කරන්නන් වාලයේ නොකළ යුතුය. උදේ හවස නොව පැයකට වරක් බැගින් මල් පූජා කළත් මලක් මෙන් අපද සීලයෙන් පිරිසිදු නොවේ නම්, මලක සුවඳ මෙන් ගුණ දහම් සුවඳ අප සතු නොවේ නම් මලක ඇති ආකර්ශනීය හැඩය සේ අප ජීවිතයේ යම් හැඩයක් නොවේ නම් අප කරන ක්‍රියාව සපල නොවනු ඇත. අපද මිය යන විට සීලයෙන් ගුණයෙන් උසස් තත්වයකට උත්තරීතර තත්වයකට පත් වීමට අපහසු වේ නම් පැන් පුරවනු පිණිස භාජනය මුනින් හරවා එයට ජලය වක්කරන්නාක් වැනි නිෂ්ඵල ක්‍රියාවකි. මෙයින් කියවෙන්නේ මාර්ග ඵල කෙසේ වෙතත් කෙලෙස් හැකි තරම් තුනී කර මෛත්‍රී, කරුණා, දයාදී ගුණයන්වත් අඩු තරමින් තිබිය යුතු බවය.

මල් පූජාව භාවනාවක් වශයෙන් ද වැඩිය හැකිය. එයද මෙම ගාථාවේ දැක්වෙන ගැඹුරු අරුතකි. අපේ සිරුරද නිතර වෙනස් වන සුළුය, ජරාවට, හෙවත් දිරාපත් වීමට නිතර ලක්වී ඇත. එනිසා අපේ සිරුර අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන පොදු ධර්මතාවයට අපද භාජනය වී ඇත. මේ මල් මෙන් මාගේ සිරුරද හට ගෙන, පැවතී, විනාසයට යාම ස්වභාවයකි.

මේ අදහස අප මල් පූජා කරන විට සිහි කළ යුතුය. එය අනිත්‍ය මෙනෙහි කිරීමයි. එසේ කිරීම කාය ගතාසති භාවනාව හෙවත් සිරුර පිළිබඳ අනිත්‍ය මෙනෙහි කිරීමේ භාවනාව වශයෙන් හැඳින්විය හැකිය. ඔබත් මල් පූජා කරන විට මේ කරුණු ස්වල්පය සිහිපත් කරගෙන මලක් වැනි ජීවිතයක් ගතකර කායගතාසති භාවනාවට වඩා උත්තරීතර තත්වයකට පත්වන්ට උත්සාහ කරනු ඇතැයි අපේක්ෂා කරමු.

**පූජ්‍ය හත්තපිටියේ පියදස්සී හිමිපාණන්**
අඹන්ඔළුව රජමහා විහාරය, ඇහැළියගොඩ.
ලිපිය ලබාදුන්නේ,
ඩබ්.ජ්.සී.ජේ. වීරසිංහ
ස.අංක 857

# දානය මහත්ඵල මහානිසංස වන හැටි...

සිදුහත් කුමරු ගේ කිරි මව් වූ මහා ප්‍රජාපතී ගෝතමිය විසින් පසු කලෙක බුදුරජානන් වහන්සේට පූජා කළ සිවුරක් බුදුරජාණන් වහන්සේ විසින් තෙවරක්ම ප්‍රතික්ෂේප කර එය මහා සංඝරත්නය වෙත පූජා කරන ලෙස උපදෙස් දුන්හ. මින් දුකට පත් මහා ප්‍රජාපතී ගෝතමිය දැක තෙරණුවෝ බුදුරජානන් වහන්සේගෙන් එසේ කිරීමට හේතුව විමසූ විට එසේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය පිළිගැන්වීමෙන් පෞද්ගලිකව බුදුරජාණන් වහන්සේට පුදනවාට වඩා කුශල් අත්වන බව පෙන්වා දුන්හ. ඉන්පසු දාන ආනිසංස දක්වන දක්ෂිණා විභංග සූත්‍රය වදාල සේක. ආනන්දය, පෞද්ගලික දාන 14 කි.

## පෞද්ගලික දාන 14

1. තථාගත අර්හත් සම්‍යක් සම්බුදුන් වහන්සේට දෙන දානය ප්‍රථම පෞද්ගලික දානයයි.
2. පසේ බුදු කෙනෙකුන්ට දෙන දානය දෙවෙනි පෞද්ගලික දානයයි.
3. තථාගත ශ්‍රාවක රහතන් වහන්සේට, දෙන දානය තුන්වෙනි පෞද්ගලික දානයයි.
4. රහත් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට දෙන දානය.
5. අනාගාමියෙකුට දෙන දානය.
6. අනාගාමී ඵල සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට දෙන දානය.
7. සකෘදාගාමියෙකුට දෙන දානය.
8. සකෘදාගාමී ඵල සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට,
9. සෝවාන් වූ කෙනෙකුට,
10. සෝවාන් ඵල සාක්ෂාත් කිරීමට පිළිපන්නෙකුට,
11. කාමයන්හි වීතරාගී බාහිර අයෙකුට,
12. පෘථග්ජන සිල්වතෙකුට,
13. පෘථග්ජන දුශ්ශීලයෙකුට,
14. තිරිසන් සතෙකුට දෙන දානය

පෞද්ගලික දාන 14 යි.

**''ආනන්දය, තිරිසන් සතෙකුට දීමෙන් සිය ගුණයක් ද පෘථග්ජන දුශ්ශීලයෙකුට දීමෙන් දහස් ගුණයක් ද, පෘථග්ජන සිල්වතෙකුට දීමෙන් සිය දහස් ගුණයක්ද, කාමයන්හි වීතරාගී බාහිර තවුසෙකුට දීමෙන් කෝටි ශත සහස්‍ර ගුණයක්ද සෝවාන් ඵලය සාක්ෂාත් කරන්නෙකුට දීමෙන් අසංඛෙය්‍ය අප්‍රමේය අනුසස් ද බලාපොරොත්තු විය හැකිය.**

**එසේ නම් සෝවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් පසේ බුදු හා සම්මා සම්බුදුවරයෙකුට දෙන දානයෙහි ආනිසංස කාට කිව හැකිද?''**

**ආනන්දය, සංඝගත දක්ෂිණා 7 කි.**

## සංඝගත දක්ෂිණා 7

1. බුද්ධ ප්‍රමුඛ භික්ෂු භික්ෂුණී සංඝයාට දෙන දානය ප්‍රථම සංඝගත දක්ෂිණාවයි.
2. බුදුන් පිරිනිවායින් පසු භික්ෂු භික්ෂුණී දෙපක්ෂයට දෙන දානය දෙවෙනි සංඝගත දක්ෂිණාවයි.
3. භික්ෂු සංඝයා විෂයෙහි දෙන දානය තුන්වෙනි සංඝගත දක්ෂිණාවයි.
4. භික්ෂුණී සංඝයා වෙත දෙන දානය හතරවෙනි සංඝගත දක්ෂිණාවයි.
5. මට මෙපමණ භික්ෂු, භික්ෂුණී සංඝයා ඕනෑ යයි ගනන් නියම කොට දෙන දානය පස්වෙනි සංඝගත දක්ෂිණාවයි.
6. මට මෙපමණ භක්ෂු සංඝයා ඕනෑ යයි ආරාධනා කොට දෙන දානය හයවෙනි සංඝගත දක්ෂිණාවයි.
7. මට මෙපමණ භික්ෂුණී සංඝයා ඕනෑ යයි ආරාධනා කොට දෙන දානය හත්වෙනි සංඝගත දක්ෂිණාවයි.

ආනන්දය, සංඝයා උදෙසා අනාගතයෙහි ඇතිවන කාසාව කණ්ඨකයන්ට දෙන දානයෙහි ද ආනිසංස අසංඛෙය්‍යය අප්‍රමෙය්‍යය යයි මම කියමි. ආනන්දය, එබැවින් කුමන විදියේ පෞද්ගලික දානයක වුවත් ආනිසංස සංඝගත දක්ෂිණාවක ආනිසංස වලට වැඩි යයි මම නොකියමි. (නත්වෙවාහං ආනන්ද කෙනෙචි පරියායෙන සංඝගතාය දක්ඛිණාය පාටිපුග්ගලිකං දානං මහප්ඵලතරං වදාමි). ආනන්දය, මහා ප්‍රජාපතී ගෝතමියගේ අලුත් වස්ත්‍ර යුග්මය මා පිළිනොගත්තේ මා ඇතුළු සංඝයාට දෙවීමෙන් ආනිසංස වැඩි කරවීම පිණිසයි. එසේ නැතිව ඇයට ඇති අහිතවත් කමක් නිසාවත්, ඇය කළ උපකාර අමතක කිරීමෙන් වත් නොවේ.

## දායකයා හා ග්‍රාහකයා යන දෙදෙනාම ගුණවත් වීම නිසා ඉතා මහත් ඵල වන දානයක් ඇත්තේය.

(1) සිල්වත් දායකයෙකු විසින් දුශ්ශීල ප්‍රතිග්‍රාහකයෙකුට දෙන දානය දායකයාගේ යහපත් බව නිසා මහත්ඵල වේ. වෙසතුරු රජතුමා හට නිර්ගුණ වූ ජූජකයාට දන් දී පොළොව පවා කම්පා කළ හැකිවූයේ ද ලොව්තුරු බුදු බව ලැබිය හැකි වූයේ ද දායකයා ගේ ගුණය නිසා දානය මහත් ඵල වන බැවිනි.

(2) දුශ්ශීලයෙකු විසින් සිල්වතෙකුට දෙන්නාවූ දානය ප්‍රතිග්‍රාහකයාගේ ගුණය නිසා මහත්ඵල වේ. කැළණි ගං මෝය අසල විසූ කෙවුලෙක් ''දීඝසෝම'' නම් වූ සිල්වත් භික්ෂූන් වහන්සේ කෙනෙකුට තෙවරක් පිණ්ඩපාතය දින. හේ මරණාසන්නයේදී 'දීඝසෝම තෙරුන් වහන්සේට දුන් දානය මා ගලවා ගන්නේය' යි කියා කාලක්‍රියා කොට දෙව් ලොව උපන්නේය.

(3) දුශ්ශීලයෙකු විසින් දුශ්ශීලයෙකුට ම දෙන දානය මහත්ඵල නොවන දානයයි. වඩ්ඪමාන නම් ගම විසූ වැද්දෙක් ඥාති ප්‍රේතයෙකු උදෙසා දුසිල් මහණකට තෙරවක්ම දන් දින. ප්‍රේතයාට පින් නොලැබිණ. තුන්වන වරදී 'මගේ දානය දුශ්ශීලයෙක් පැහැර ගන්නේය' යි ප්‍රේතයා කෑ ගැසීය. පසුව සිල්වතකු සොයා දන්දී පින් දුන් කල්හි ප්‍රේතයාට පින් ලැබිණි.

(4) සිල්වතකු විසින් සිල්වතෙකුටම දෙන දානය උත්තම වේ. දෙපක්ෂය ශුද්ධ ගුණවත් නිසා ඒ දානය විශේෂයෙන්ම මහත්ඵල වේ.

## ත්‍රිවිධ දාන සම්පත්තිය

දන් දීම කුඹුරු වැපිරීමක් වැනිය. කුඹුරක් වැපිරීමෙන් බොහෝ ඵල ලැබෙන්නේ කුඹුරය, වපුරන වීයය, ගොවියාය යන තුනම යහපත් වූ කල්හිය. දන් දීමේදී ප්‍රතිග්‍රාහකයා කුඹුර වැනි ය. දෙන්නා වූ වස්තුව වපුරන වීය වැනිය. දායකයා ගොවියා වැනි ය. හොඳ කුඹුරක හොඳ වීයක් හොඳ ගොවියෙකු විසින් වපුල හොත් මහත් අස්වැන්නක් ලැබෙන්නාක් මෙන්, යහපත් කුඹුර වැනිවූ ගුණවත් ප්‍රතිග්‍රාහකයෙකු හට, යහපත් වීය වැනි වූ ධර්මයෙන් උපයා ගත් වස්තුවක් කුඹුරු වැඩ හොඳින් දත් අනලස ගොවියෙකු වැනි වූ කම්පල හා ප්‍රතිග්‍රාහකයන්ගේ ගුණ දැන ගැනීමට සමර්ථ වූ ද චේතනාත්‍රය පිරිසිඳු කර ගැනීමට සමර්ථ වූ ද දායකයකු විසින් දෙන ලදුයේ නම් එයින් බොහෝ අනුසස් ඇත්තාවූ මහත් වූ කුශලයක් ලැබෙන්නේය. කුඹුරු වැපිරීම ගැන කියන ලද කරුණු තුනෙන් එකක් මුත් නොමනා වුවහොත් එයින් ලැබෙන ඵලය හීන වන්නාක් මෙන් දන් දීම සම්බන්ධයෙන් කී කරුණු තුනෙන් එකකුදු හීන වුව හොත් පුණ්‍ය ඵලයද හීන වේ. හීන වීමයයි කියනුයේ කිසිම ඵලයක් නොලැබී යාම නොව, ඵල අඩුවීමය. හොඳම ප්‍රතිග්‍රාහකයෙකු සොයා ගෙන දන් දීම යහපති. එබැවින් :

''විචෙය්‍ය දානං දාතබ්බං - යත්ථ දින්නං මහප්ඵලං
විචෙය්‍ය දානං දත්වාන - සග්ගං ගච්ඡන්ති දායකා''

යනුවෙන් වදාරන ලදී.

'යම් තැනකට දෙන ලද දානය මහත් ඵල වේද එතැන සොයා දන් දිය යුතුය. විමසා දන්දීම හේතු කොට දායකයෝ ස්වර්ගයට යන්නාහ යනු එහි තේරුමයි.

''විචෙයය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ''

මේ ලෝකයෙහි යමෙක් දක්ෂිණේයයෝ වෙත් ද ඔවුන් සොයා තෝරා ගෙන දන් දීම බුදුන් වහන්සේ විසින් පසස්නා ලද්දේය. යම් සේ යහපත් කුඹුරක වපුළ විය බොහෝ ඵල ගෙන දෙන්නේ ද එමෙන්ම තෝරා ගත් ගුණවතුන්ට දෙන දානය බොහෝ ඵල ගෙන දෙන්නේය' යනු එහි තේරුමයි.

''කාලෙ දදන්ති සප්පඤ්ඤා - වදඤ්ඤූ වීතමච්ඡරා
කාලෙන දින්නං අරියෙසු - උජුභූතෙසු තාදිසු
විප්පසන්නමනා තස්ස - විපුලා හොති දක්ඛිණා''

මසුරු මල දුරු කළාවූ දෙන ස්වභාවය ඇත්තාවූ නුවණැත්තෝ දීමට සුදුසු කල්හි දන් දෙති. කාය වාචා චිත්ත වංකයන් ප්‍රහීන බැවින් අවංකවූ ඉෂ්ටානිෂ්ටයන්හි ඇල්ම හා කෝපය නැත්තාවූ ආර්‍යයන් කෙරෙහි ප්‍රසන්න සිත් ඇත්තාවූ යමෙක් දන් දේද, ඔහුගේ දානය මහත්ඵල වන්නේ ය යනු ගාථාවෙහි අදහසයි.

## අසත්පුරුෂ දාන පස

''පඤ්චිමානි භික්ඛවෙ, අසප්පුරිස දානානි, කතමානි පඤ්ච? අසක්කච්චං දානං දෙති, අචිත්තී කත්වා දානං දෙති, අසහත්ථා දානං දෙති, අපවිද්ධං දානං දෙති, අනාගමන දිට්ඨිකෝ දානං දෙති, ඉමානි බො භික්ඛවෙ, පඤ්ච අසප්පුරිස දානානි.''

යනුවෙන් අංගුත්තර නිකාය පඤ්චක නිපාතයෙහි අසත්පුරුෂ දාන පසක් දක්වා තිබේ. ඒ මෙසේය:

(1) ප්‍රතිග්‍රාහකයන්ට සුවසේ වැළඳිය හැකි වන පරිද්දෙන් සකස් නො කොට නො මනා කොට දෙන දානය එක් අසත්පුරුෂ දානයෙකි.

(2) දාන වස්තුව කෙරෙහි හා ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි ආදර ගෞරවයක් නැතිව දෙන දානය එක් අසත්පුරුෂ දානයෙකි.

(3) සියතින් නොදී වැඩකාරාදී අනුන් ලවා දෙවන දානය එක් අසත්පුරුෂ දානයෙකි.

(4) නිතර නොදී නරක් වූ දෙයක් අහක දමන්නාක් මෙන් කලාතුරකින් දෙන දානය එක් අසත්පුරුෂ දානයෙකි.

(5) මතු පුණ්‍ය ඵලය ලැබීමේ බලාපොරොත්තුව නැතිව දෙන දානය එක් අසත්පුරුෂ දානයෙකි.

දීමට පිළියෙළ කරන ආහාරය මනා වර්ණයෙන් හා ගන්ධයෙන් ද රසයෙන් හා ඕජාවෙන් ද යුක්ත කොට පිළියෙළ කිරීම දාන වස්තුවට ගෞරවාදර කිරීමය. එසේ නොකොට වැලිකැට ගල්කැට සහිතව ලුණු ඇඹුල් නැතිව දානය පිළියෙළ කිරීම දාන වස්තුවට අනාදර අගෞරව කිරීමය, දෙන කල්හි දීමට සුදුසු උත්තම ප්‍රතිග්‍රාහකයන් සොය ඔවුනට දීම. ප්‍රතිග්‍රාහකයන්ට ගෞරවාදර කිරීමය, දෙන දෙය කාහට ගියත් කම් නැතැයි ප්‍රතිග්‍රාහකයන් නො සොයා දුටු කෙනෙකුට දීම, ප්‍රතිග්‍රාහකයන් ට අනාදර අගෞරව කිරීමය. ප්‍රතිග්‍රාහකයන්ගේ වැඩ පාළු වන සැටියට බොහෝ දුර සිට සුළු දෙයක් දීම ද, තම තමන්ගේ තැන්වල සිසිල් සෙවනේ කරදරයක් නැතිව ආහාර ගන්නා භික්ෂූන්ට එයට ඉඩ නොදී දුර තද අව්වේ ගෙන්වා වෙහෙසවා දෙන දානද අසත්පුරුෂ දාන සංඛ්‍යාවට ඇතුළත් වන බව කිය යුතුය.

දන් දෙන කල්හි ඒ දෙන දානය අසත්පුරුෂ දානයක් නොවී සත්පුරුෂ දානයක් වන සැටියටම දන් දීම කළ යුතුය. දානය යහපත් වනුයේ ප්‍රතිග්‍රාහකයන්ට එයින් යහපතක් වන හැටියට දුනහොත්ය. ප්‍රතිග්‍රාහකයින්ට අලාභ හානි කරදර වන සැටියට දෙන දානයක් නොදීමම යහපති. භික්ෂූන්ට දන් දෙන ඇතැම්හු තමන්ගේ දානය භික්ෂූන් බොහෝ ගණනක් ගෙන්වා ගෙන දෙන්නට කල්පනා කරනවා මිස, ඒවා පිළිගන්නට වඩින භික්ෂූන්ට වන කරදර අලාභ හානි ගැන කල්පනා නො කරති. දෙන දානයෙන් ප්‍රතිග්‍රාහකයාට ලැබෙන ලාභයට වඩා මහත් කරදරයක් අලාභයක් වේ නම්, ඒ දීමෙහි කිසි තේරුමක් නැත. දෙන අය විසින් බැලිය යුත්තේ බොහෝ දෙනෙකුට දීම ගැන නොව ප්‍රතිග්‍රාහකයන්ට පහසුවක් ලාභයක් සුවයක් වන සැටියට ටික දෙනෙකුට වුවත් දීම ගැනය. දන් දීමේ පරමාර්ථය අනුන්ට පහසුවක් ඇති කිරීමය.

## අසත්පුරුෂ දානයේ විපාක

අසත්පුරුෂ දානය දුන්නවුන්ට එහි විපාක වශයෙන් ඔවුන්ගේ දානය සේම අයහපත්වූ භව භෝග සම්පත් ලැබෙන්නේය. ඔවුනට සංසාරයේදී ලැබෙන්නේ මියන්ගෙන් වේයන්ගෙන් මැස්සන්ගෙන් හානි වූ දේය. සමහරු දුශ්ශීලයන් කෙරෙහි සංඝයා උදෙසා දන් දෙන්නාහුය. ආනන්දය: එකල්හි ද මම සංඝගත දක්ෂිණාවේ ආනිසංස අසංඛෙය්‍ය අප්‍රමේය්‍ය වන බව පවසමි. ආනන්දය: කිසිම ආකාරයකින් සංඝගත දක්ෂිණාවට වඩා පෞද්ගලික දානය මහත් ඵලතරය යි මම නො පවසමි යි තථාගතයන් වහන්සේ සාංඝික දානයේ ආනිසංසය වදාළ සේක.

## දුන් අත්බැවින් ම විපාක ලැබෙන දානය

වස්තු සම්පත්තියය. ප්‍රත්‍යය සම්පත්තියය. චේතනා සම්පත්තිය ය, ගුණාතිරේක සම්පත්තිය ය යන චතුස් සම්පත්තියෙන් යුක්ත දානය, දුන් අත් බැව්හිම විපාක දෙන්නේය. වස්තු සම්පත්තිය යනු ප්‍රතිග්‍රාහකයා අනාගාමී වූ හෝ රහත් වූ හෝ කෙනෙකු වීම ය. චේතනාසම්පත්තිය යනු දීමට පූර්වයෙහි හා දෙන කල්හි ද ඉන් පසුවද සෝමනස්ස සහගත ඥාන සම්පයුක්ත කුශල චේතනා ඇති බවය. ගුණාතිරේක සම්පත්තිය යනු ප්‍රතිග්‍රාහකයා එදින නිරෝධසමාපත්තියෙන් නැගී සිටියෙක් වීමය. මේ චතුස් සම්පත්තිය ලැබිය හැක්කේ බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා හා ධ්‍යාන ලාභී අනාගාමීන් ඇති කාල වලදීය. චතුස් සම්පත්තියෙන් යුක්ත කොට දන් දුන් කල්හි ඇතමකුට එදිනම විපාක ලැබේ. ඇතමකුට සත් දිනක් ඇතුළත ලැබේ. ඇතමකුට ඒ ජාතියේදී යම් කිසි අවස්ථාවක ලැබේ.

චතුස්සම්පත්තියෙන් යුක්ත කොට මෙලොව ම විපාක ලැබෙන සැටියට දන් දීම පහසු කාර්‍යයක් නොවේ. අනාගාමීන් හා රහතුන් නො ලැබිය හැකි බැවින් මෙ කල එය නො කළ හැකි ය. දහස් ගණන් රහතන් වහන්සේ වැඩ විසූ අතීතයේදී ද මෙලොව විපාක ලැබෙන සේ දන් දිය හැකි වූයේ ඉතාම ටික දෙනකුට පමණකි. මෙකල දන් දෙන්නවුන්ට ඉහතආත්මේ භාවයේ ලැබෙන ආනිසංස සර්වාකාරයෙන් නැත්තේ ම නොවේ. දන් දීමෙන් මෙලොව දී ලැබෙන අනුසස් විචාළා වූ සීහ සේනාපතියාට, බොහෝ දෙනාට ප්‍රිය වීමය, සත් පුරුෂයන් විසින් භජනය කරනු ලැබීමය, කීර්තිය පැතිර යෑමය, නිර්භීත ව පිරිස් මැදට යා හැකි බවය යන ආනිසංස සතරක් මෙලොව ලැබෙන බව බුදුන් වහන්සේ වදාළ සේක. සැදැහයෙන් දන් දෙන පින්වතුන්ට නීරෝග බව, දීර්ඝායුෂ්ක බව, හදිස්සියෙන් ධනයෙන් නො පිරිහෙන බව, සතුරු උවදුරු මඳ බව යනාදී තවත් අනුසස් ලැබෙන්නේය. එය ග්‍රහයන් ගෙන් වන ඵලාපලයන් සේ අප්‍රකටය.

*අපවත් වී වදාල රේරුකානේ චන්ද විමල හිමිගෙ ලිපියක් හා පොත පත ඇසුරෙන් ආචාර්ය චන්දන ජයරත්න මහතා විසින් සකසන ලදී.*

## ප්‍රේත ලෝක දොළහ

1. සෙම සොටු ආහාර කොට ඇති මත්තාස නම් ප්‍රේත ලෝකය
2. මිනිසුන්ගේ හා සතුන්ගේ මළ කුණු ආහාර කොට ඇති කුණාපාස නම් ප්‍රේත ලෝකය
3. අසුචි ආහාර කොට ඇති ගූථඛාදක නම් ප්‍රේත ලෝකය
4. කටින් නික්මෙන්නා වූ ගිනිදැල් ඇති අග්ගිජාලමුඛ නම් ප්‍රේත ලෝකය
5. ඉඳිකටු මලකය පමණ වූ මුඛයක් ඇති මහා සැලියක් පමණ කොට ඇති සූචිමුඛ ප්‍රේත ලෝකය
6. සාගින්නෙන් හා පිපාසයෙන් නිතර පෙළෙන බැවින් ආහාර පාන ආශාවෙන් පෙළෙන තණ්හට්ටිත ප්‍රේත ලෝකය
7. ගින්නෙන් දාගිය කණුවක් මෙන් වියලී ගිය ශරීර ඇති සුනිජ්ඣාමක නම් ප්‍රේත ලෝකය
8. ආයුධ වැනි වූ තියුණු තමාගේ ශරීරයට කැපෙන නිය ආදී ශරීර අවයව ඇති සත්ථංග ප්‍රේත ලෝකය
9. පර්වත තරම් විශාල ශරීර ඇති සබ්බතංග ප්‍රේත ලෝකය
10. පිඹුරන්ගේ ශරීර වැනි ශරීර ඇති අජගරංග ප්‍රේත ලෝකය
11. විමානවල ඉපිද සැපදුක් දෙකම කලින් කළ විඳින්නාවූ වේමානික ප්‍රේත ලෝකය
12. කැළෑවල වාසය කරන්නාවූ මහත් වූ සෘධි ඇති මහිඩ්ඩිත නම් ප්‍රේත ලෝකය

සා. අංක 103


## අටමහ කුසල්

*කඨිනංච පරික්ඛාරං - වාසදානංච උත්තමං*
*බුද්ධප්පමුඛ සංඝස්සං - දානං ධම්මස්ස ලේඛනං*
*ඛෙත්තදානංච සංඝස්ස - පටිමාකරණම්පිච*
*කරනං වච්ච කුටියා - අට්ඨ පුඤ්ඤානි වුච්චරෙ*

මෙම ගාථා දෙකෙහි එන පිළිවෙලට අටමහ කුසල් නම්

1. කඨින සිවුරක් පූජා කිරීම.
2. අටපිරිකරක් පූජා කිරීම.
3. ආවාස ගෙයක් තනවා සහ සතු කර පූජා කිරීම.
4. බුදුපාමොක් මහ සඟනට සඟසතුකර දන්දීම.
5. බුද්ධ ධර්මය ලිවීම හා ලියවීම.
6. සඟසතුකර හෝ බුද්ධ පූජා වශයෙන් හෝ කෙත් වතු පිදීම.
7. බුදු පිළිම තැනවීම (ධාතු චෛත්‍ය, විහාර මන්දිර, මලසුන් හා බෝධි රෝපනය ද මෙයට අයත් වේ).
8. වැසිකිලි තනවා සඟසතු කර දීම.

සා. අංක 103



## "සල්ලේඛ" සූත්‍රයට අනුව ඔබේ ජීවිතය හැඩගසා ගැනීමෙන් උතුම් පුද්ගලයෙකු වන්න"

**මජ්ඣිම නිකායේ "සල්ලේඛ" සූත්‍රයට අනුව පුද්ගල චිත්ත සන්තානයේ (සිතේ) පවතින්නාවූ ආස්‍රව ධර්මයන් හේතුකොට ගෙන හටගන්නාවූ මනෝ විකෘති 44ක් ඇත.**

'(1) අනුන්ට හිංසා කිරීම
(2) සතුන් මැරීම
(3) අන්සතු දේ ගැනීම
(4) කාමයෙහි වරදවා හැසිරීම
(5) බොරු කීම
(6) කේලාම් කීම
(7) පරුෂ වචන කීම
(8) නිෂ්ප්‍රයෝජන වචන කීම
(9) අනුන්ගේ දේ ගැන ඇති ආසාව
(10) දූෂිත කරන හිත් ඇති බව
(11) වැරදි සහිත දර්ශනය
(12) වැරදි අකුසල සංකල්පය
(13) වැරදි සහිත වචන කථා කිරීම
(14) වැරදි කර්මාන්ත කිරීම
(15) වැරදි ජීවිකාව
(16) වැරදි ව්‍යායාමය
(17) වැරදි සිහිය
(18) වැරදි සමාධිය
(19) නරක ක්‍රියා කොට හොඳ ක්‍රියා කලේ යැයි සිතීම
(20) වැරදි විමුක්තිය
(21) ථීන මිද්ධයෙන් (සිත් කැලඹුණු ස්වභාවය) යුක්ත වීම
(22) උඩගු බව
(23) සැක ඇති බව
(24) කිපෙන සුළු බව
(25) බද්ධ වෛරය
(26) ගුණමකු බව
(27) තමා උසස් කොට සිතීම
(28) ඊර්ෂ්‍යා සහගත බව
(29) මසුරු බව
(30) කෛරාටික බව
(31) මායාමය (මුළාකරන) ගති ඇති බව
(32) තද පරුෂ බව
(33) මානාධික බව
(34) අකීකරු බව
(35) පාප මිත්‍රයන් ඇති බව
(36) ප්‍රමාද බව
(37) පැහැදීම රහිත බව
(38) පාපයට ලැජ්ජා නැති බව
(39) පවට බිය නැති බව
(40) අල්ප ශ්‍රැත බව
(41) කුසීත බව
(42) සිහිමුළා ඇති බව
(43) මෝඩ බව
(44) ආදානග්‍රාහී (තමන් පමණක් හරිය යන) බව

**මජ්ඣිම නිකායේ මෙම සූත්‍රයේ විවරණය වන මනෝ විකෘති 44 (මානසික රෝග) ට ප්‍රතිකාර 44 ක් ද දක්වා ඇත. මනෝ විකෘතියට ප්‍රති විරුද්ධ දේ කිරීමය.**

**නිදසුනක් ලෙස :** අනුන්ට හිංසා කිරීම සඳහා වූ විකෘතිය (රෝගය) ට ප්‍රති කර්මයක් වශයෙන් අනුන්ට හිංසා නොකිරීමය. සෙසු ඒවා ද මෙසේමය.

## අදිටන

1. අත් හැඟුමෙන් මිදී, යොමු වී ලෝ වැඩට
සත් දන කරන පැතුමක් ඉටු වන බවට
සස්කුරු කුමට? එය වැරැදි යනොත් හෙට
පත්මය නො මැ පිපෙයි පායන දිනිඳු හට

**අරුත -**

තමන් පිළිබඳ හැඟුමෙන් මිදී ලෝ වැඩ (පරාර්ථය) සඳහා යොමු වී උතුම් මිනිසුන් කරන පැතුම් ඉටු වන බවට සහතික කුමටද? එ මැ පැතුම් ඉටු නො වේ නම් හෙට ඉර පායන කලැ නෙළුම නොපිපෙනු ඇත.

2. සිහි කොට ඔබ රකින එක සික පද වුවද
තිර කොට පිහිටුවන සිතැ අදිටනක් සොඳ
කළ විට එ අදිටන ඔබගේ සිතැගි සඳ
නැඟුමට පෙර අඹර වනු ඇති සැකෙක් කො ද?

**අරුත -**

ඔබ රකින එක සිල් පදයක් වුව ද සිහි කොට සිතෙහි තරයේ මනා අදිටනක් (අධිෂ්ඨානයක්) ඇති කැර ගත හොත් ඔබගේ සිතෙහි ඇති රිසි නැමැති සඳ උදා වීමට නැඟෙනහිර අහස එ මැ අදිටන මැ වන බවට සැකයෙක් නැති.

මෙත්සවිය සාමාජික
*-අරිසෙන් අහුබුදු ශූරීන් විසිනි-*

---

**උජු ගුණය වඩන්නෙමි
සෘජු ගුණය සමගින්
සුව වී නිවී සැනහී
මුදු බවම ලබා ගම්
අනතිමානි ගුණය සමගින්
නම්‍යශීලී බවට පත්වෙමි
'මෙත් සවිය' සවියක් කොට
ජීවන දසුනක් සදා ගනිමි
ඇදුරාණනි........
සසර මඟ කෙටි කරන්නට
ඔබෙන් ලබනා අත්වැල
මහ මෙරක් වීය
මා හට**

*නන්දනී බණ්ඩාර මහත්මිය*
**සා. අ. 6-1080**

# නිවේදන සහ නොමිලයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

**වැදගත්**

❖ මෙත් සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශීල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවලද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන්කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබියාම පිළිබඳව වග කියනු නොලැබේ.

- සංස්කාරක -

## මෙත්සවිය දුරකථන අංක

**මෙත්සවිය තොරතුරු විමර්ශනය කරනවිට පරිපාලන නිලධාරී මහතා** අමතන්න (0714-014467). එම දුරකථනයේ බිල්පත් ගෙවනු ලබන්නේ මෙත්සවිය මෛත්‍රී සංසදය විසිනි.

**මීට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (0777-710765) හා බී. ඩබ්. චමින්ද (දු.ක. 0773-065807)** යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

**සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385)** මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදුකරන්න. (දිනකට දුරකථන පණිවිඩ 30 ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම සිදුකරන්නේ නම් මැනවි.)

## අටවන භාවනා වැඩසටහන

**ඉහත වැඩසටහන 2006.03.12 දින ආරම්භ විය. ජූනි මස ඇරඹීමට බලාපොරොත්තු වන මීළඟ භාවනා හා චිත්ත සංයම අභ්‍යාස පිළිබඳ ත්‍රෛමාසික වැඩසටහන සඳහා අයදුම් පත් 2006.05.30 දිනට පෙර කාර්යාලයට ලැබෙන්නට සලස්වන්න.**


**මනාව සැලසුම් කල සොඳුරු නිවසක් සඳහා**

**Home Sweet Home Design**

161, කන්දවිහාර පාර, කළුවාමෝදර, අලුත්ගම.
034-2272040

එම්. ඒ. එල්. චන්ද්‍රලතා
වාස්තු විද්‍යා තාක්ෂණඥ
(Architectural Technologist)


**ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ පස් වන වැඩ සටහන**

**මෙම වැඩසටහන 2006.05.26 දින පෙ.ව. 10.30 ට අරඹනු ලැබේ.**


**ඔබේ මංගල සිහිවටනය විශේෂ අවස්ථා ඡායාරූපගත කර ගැනීමට**

විමසන්න: මෙත්සවිය සාමාජික
එස්. පී. පියරත්න
නො: 2/6/ඩී, ගම්පහ පාර
මිරිස්වත්ත
ටෙලි: 03322 26534



**දෙමළ භාෂාව විෂය ශ්‍රේණි 2 සිට 11 දක්වා ඉගැන්වීම**

වැඩිහිටි පුද්ගලයින් සඳහා ද පන්ති පැවැත්වේ
වජිරා ගුණවර්ධන මහත්මිය අමතන්න.
දුරකථන අංකය :-2935866. (සා.අ.500)



## ඇබෑර්තු

මෙත්සවිය සාමාජිකාවක් වන ප්‍රවීන මැහුම් ශිල්පිනියක් විසින් අළුතින් ඇරඹීමට යන මැහුම් ආයතනයට පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව සේවයේ යෙදිය හැකි දක්ෂ පළපුරුදු ගැහැණු මැෂින් ඔපරේටර් වරින් කිහිප දෙනෙකු අවශ්‍යයය.

වැටුප රු:5000/- ක් පමණ -
සම්මුඛ පරීක්ෂණ සෙනසුරාදා ප.ව. 4.00-7.00 දක්වාත්
ඉරිදා උදේ 9.00 - පස්වරු 7.00 දක්වාත්
පහත සඳහන් ස්ථානයේ පැවැත්වේ.
සහතික සමඟ පැමිණ විමසන්න.

අංක: 176, තල්පිටිය උතුර, ගාලුපාර, පානදුර. (තල්පිටිය පාලම අසල රිවර්වීව් හෝටලයට නුදුරින්) දුරකථනය: 071 2220158

සා.අ. 5 - 1045

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත්ද භාර ගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන්ම රහසිගතව තබා ගනු ලැබේ.)**

1. සම්පූර්ණ නම ..............................................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය .............................. 3. ජාතික හැඳුනුම්පත් අංකය. ..............................
(ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය .............................. 5. වයස .................... 6. ආගම ..............................

7. ස්ථිර ලිපිනය ..............................................................................

..............................විද්‍යුත් තැපැල් (e-mail) .............................. දුරකථන අංකය ....................

8. දිස්ත්‍රික්කය .............................. 9. විවාහක / අවිවාහක බව ..............................

10. රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර: ..............................................

..............................................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන අංකය:..............................................

12. ලිපි එවිය යුතු ලිපිනය: ..............................................

13. ලබා ඇති ඉහළම අධ්‍යාපනික සුදුසුකම්
1. ..............................................................................
2. ..............................................................................

14. වෙනත් සංගම් ආදියෙහි තනතුරු හෝ සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර
1. ..............................................................................
2. ..............................................................................
3. ..............................................................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..............................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..............................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදී වැගත්යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා/අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න. ..............................................

..............................................................................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය .............................. අයදුම්කරුගේ අත්සන ..............................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය ..............................

තේරීම් කමිටුවේ තීරණය

..............................
තේරීම් කමිටු සභාපති

..............................
විධායක ලේකම්

දිනය ..............................

**සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත්පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපැල් ගාස්තු, විදුලිය ගාස්තු, කාර්යාල ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 1000/=ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (ඒ ඇතුළත්වීමේ ගැස්තුව රු. 500/= හා වාර්ෂික සාමාජික මුදල රු.500/=වශයෙනි.) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායමක් ලබන පවුල්වල අය තම ආදායම තහවුරුකළ හැකි ලිපි ලේඛන සහිතව ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තුව ඉවත්කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ). කාර්යාලය සෙනසුරාදා, ඉරිදා ද ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙකුම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත් වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.**

*නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 4"x9" ප්‍රමාණයේ ලිපිනය ඇති මුද්දර කවර දෙකක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මඟින් යොමුකරන්න.*
*(අයදුම් පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක්පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)*
*ලිපිනය- ගරු ලේකම්, මෙත් සවිය, ශ්‍රී විජයාරාමය, පොකීර්කා පාර, කොළඹ 06. දුරකථන 0714-014467*

කිසි කලෙක අපේ රටේ ජනතාව වෙනුවෙන් සේවයක් කරන්නට නම් බැණුම් ඇසීමට ශක්තිය ඇතිවම ඉදිරිපත් විය යුතුය. එසේ බැණුම් ඇසීමට හැකිද? සිංහල මිනිස්සු මහ පුදුම මිනිස්සු කොටසක්.... ඔවුනට සේවය කළත් නොකළත් බණිනවා සේවය කළොත් වැඩියෙන් බණිනවා. ඒවාට සිනාසී වැඩ කරන්නට හැකි නම් ලංකාවේ ජනතාවට සේවය කළ හැකිය.

"අනගාරික ධර්මපාල තුමා"

මෙත් සවිය





මෙත්සවිය සංසදයේ ගරු අනුශාසක භාවනා කම්මට්ඨානාචාර්ය අති පූජ්‍ය මඩවල උපාලි ස්වාමීද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් කොළඹ ධම්මගවේශී බෞද්ධාශ්‍රමයේදී 2005.10.02 දින පැවැත්වූ මෙත්සවිය වාර්ෂික මහ සභාරැස්වීම සහ ඉන්පසු අතිපූජ්‍ය මඩවල උපාලි ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පැවැත්වූ භාවනාව පිළිබඳ ධර්මදේශනාවට සවන්දෙන පිරිස.






2006.02.05 දින ප්‍රථම ඉරුදින මාසික වැඩසටහනේ දී යෝග උපදේශක චාමින් වර්ණකුල මහතා විසින් යෝග අභ්‍යාස ක්‍රම හඳුන්වදුන් අවස්ථාව

# පිං පොතෙන් බිඳක්....




2006.01.08 දින කෝවිලක පූජා කරත්තයේ බඳින ගවයෙකු මස් කඩයකට විකුණා තිබියදී අතිපූජ්‍ය ආනන්ද ස්වාමීද්‍රයන් වහන්සේගේ මූලිකත්වයෙන් රුපියල් එක්ලක්ෂ පන්දහසක මුදලක් ගෙවා නිදහස් කිරීම



අසරණ කාන්තාවක් සඳහා භාරදීමට මහන මැෂිමක් සාමාජික මහතෙකු විසින් පිරිනැමූ අවස්ථාව



2006.01.01 දින පහන් 2550 ක් දල්වා බෝධිපූජා පිංකම් මාලාව ශ්‍රී විජයාරාමයේදී පැවැත්වූ අවස්ථාව







2006.01.08 දින මෙත්සවිය සාමාජිකයින් විසින් අසරණ ළමුන් වෙනුවෙන් අධ්‍යාපනික කටයුතු සඳහා ශිෂ්‍යත්ව අරමුදල ආරම්භ කළ අවස්ථාව





2006.01.08 දින හත්වන භාවනා කණ්ඩායමේ සාමාජිකයින් සඳහා සරත් ඉලංගන්තිලක මහතා විසින් පන්සිල් සුරකිමු පෝස්ටරය පරිත්‍යාග කරන අවස්ථාව




ආබාධිත පුද්ගලයෙකු වෙනුවෙන් බයිසිකලයක් අළුත්වැඩියා කර දීම



මුහුණ විරූප වූ එම්. ඒ. ඩී. මැන්දිස් මහතා වෙනුවෙන් ශෛල්‍ය කර්මයක් සඳහා සාමාජිකයින් විසින් ලබා දුන් මුදල් පරිත්‍යාග කිරීම




2005.10.02 දින අසරණ සරන කමිටුව විසින් කළ නවත් ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකා ජාතික දෘෂ්‍යාබාධිත වූවන්ගේ සම්මේලනය වෙත සුදු සැරයටි මිලදී ගැනීමට ආධාර කරන අවස්ථාව




සාමාජිකයින් සහ ඔවුන්ගේ දරු දැරියන් වෙනුවෙන් 2005.07.03 දින පැවැත්වූ සාර්ථකව ඉගෙන ගන්නා අන්දම සහ විභාග සමත් වන ක්‍රම පිළිබඳ දේශනය




2006.01.01 දින පැවැත්වූ වසරේ ප්‍රථම දාන-සීල-භාවනා වැඩසටහන අවස්ථාවේදී සංසදයේ සාමාජික යින් විසින් බුද්ධ ශ්‍රී මුඛ දේශනාව ඇතුලත් රුපියල් 34000/- වටිනා ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව රාජගිරියේ තපෝවනය භාවනා මධ්‍යස්ථානයට පූජා කරන අවස්ථාව

# පිං පොතෙන් බිඳක්....











අරිසෙන් අහුබුදු ශූරීන් විසින් "සිරිදෙස්ම" මැයෙන් මුද්‍රණය කළ ග්‍රන්ථය අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත සහ සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා වෙත කොළඹ 07 ධම්මගවේශී බෞද්ධාශ්‍රමයේදී 2005.11.10 දින පැවැත්වූ මාසික රැස්වීමේදී පිරිනමන අවස්ථාව හා මහියංගනයට බුදුරජාණන් වහන්සේ වැඩම කළ අවස්ථාවේ ලක්වැසි ජනතාවට කළ දේශනාව සහ පැරණි ලංකාවේ ශ්‍රී විභූතිය පැහැදිළි කරමින් අරිසෙන් අහුබුදු ශූරීන් විසින් කරන ලද දේශනයට සවන්දෙන මෙත්සවිය පිරිස.





2005.10.10 දින අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පැවිදි දිවියට හැට වසරක් සපිරෙන අවස්ථාවේ දී පැවැත්වූ පිංකම් මාලාවේදී මෙත් සවිය සාමාජිකයන්ගේ මුදලින් කොළඹ මහරෝහලේ ළමා වාට්ටුවට උණුවතුර සැපයීම සඳහා බොයිලේරුවක් පූජා කරන අවස්ථාව සහ එහි හෙදි ශාන්තිනී මහත්මිය විසින් එය භාර ගන්නා අවස්ථාව.







2006.01.08 දින ශ්‍රී විජයාරාමයේදී භාවනා වැඩසටහන අවසන්වීමෙන් පසු සිර කළ නාගයින් නිදහස් කිරීමේ අවස්ථාව